# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජනවාරි 2022

## (302) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
(Management Accounting and Finance)

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100 ක් ආවරණය කරමින් කොටස් 3 කින් සමන්විත විය.

1. **A කොටසට** ලකුණු 20 සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 4 ක් (1 - 4) ඇතුළත්ය.
2. **B කොටසට** ලකුණු 30 සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න තුනක් (5 - 3) ඇතුළත්ය.
3. **C කොටසට** ලකුණු 50 සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 3ක් (8 - 10) ඇතුළත්ය.

## <u>A කොටස</u>

### ප්‍රශ්න අංක 01

(1) සංවිධානයක් සඳහා කලමනාකරණ ගිණුම්කරණය වැදගත් වන්නේ කුමක් නිසාදැයි හඳුනා ගැනීම.

(2) සමච්ඡේද ලක්ෂ්‍යය සහ සුරක්ෂිත ආන්තිකය ඒකකවලින් ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

**කාර්යසාධනය:**

**(a)** නිවැරදි උත්තර ලියමින් බොහොමයක් අයදුම්කරුවන් සම්පූර්ණ ලකුණු ලබාගත්හ. මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය හොඳ විය. සෑම මට්ටමකදීම තීරණ ගැනීම,අනාගත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම, උපාය මාර්ගික තීරණ ගැනීම ආදී කළමනාකරණ ගිණුම්කරණයේ වැදගත්කම පිළිබඳ බොහෝ පැතිකඩ දක්වමින් මෙම ප්‍රශ්නය සඳහා අයම්කරුවන්ගේ කාර්යසාධනය හොඳ විය. කෙසේවෙතත් සමහර අයදුම්කරුවන් කරුණු දෙකම විකෘති කර (tasted) එකම උත්තරය නැවත ලියා තිබූ බව දක්නා ලදී. එබඳු විකෘති කිරීම් තුළින් අතිරේක ලකුණු නොලැබෙන හෙයින් එපරිදි නැවත ලිවීම් මඟහැරිය යුතුය.

**(b)** සමච්ඡේද ලක්ෂ්‍යය ගණනය කිරීම වෙනුවෙන් අයදුම්කරුවන්ගෙන් බහුතරය සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය. එහෙත් සුරක්ෂිත ආන්තිකය ගණනය කිරීම සඳහා දුර්වල ලකුණු ලබාගෙන ඇත.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) සමහර අයදුම්කරුවන් රු.12/- ක විචල්‍ය පිරිවැය පමණක් ආන්තික පිරිවැය ලෙස හඳුනාගෙන ඇත. ඔවුන් ඍජු ද්‍රව්‍ය පිරිවැය සහ ඍජු ශ්‍රම පිරිවැය නොසලකා ඇත.

(2) සමහර අයදුම්කරුවන් සුරක්ෂිත ආන්තිකය ප්‍රතිශතයක් ලෙස ගණනය කර ඇත.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අයදුම්කරුවන් මෙබඳු ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය. ආන්තික පිරිවැය සහ සුරක්ෂිත ආන්තිකය යන පදවල තේරුම අවබෝධකර ගත යුතුය.

## ප්‍රශ්න අංක 02

2021 වර්ෂයේ ප්‍රාග්ධන චක්‍රයේ දින ගණන ගණනය කිරීමේ හැකියාව පරීක්ෂාවට ලක්කොට ඇත.

**කාර්යසාධනය:**

කාර්යසාධනය සාමාන්‍යයෙන් සතුටුදායක මට්ටමක තිබුණේය. අයදුම්කරුවන් කාරක ප්‍රාග්ධන චක්‍රයේ ද දින ගණන නිවැරදිව ගණනය කර සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) දී තිබෙන වෙලඳ ලැබිය යුතු මුදල් පිරිවැටුම් අනුපාතයෙන් වෙළඳ ලැබිය යුතු දින ගණන සොයා ගැනීමට නොහැකි වීම.

(2) දී තිබෙන විකුණුම් පිරිවැය සංඛ්‍යාවෙන් ණයට මිලදී ගැනීම් ගණනය කිරීමට නොහැකි වීම.

(3) 2021 සඳහා මිලදී ගැනීම් ප්‍රමාණය සෙවීමේදී ආරම්භක සහ අවසාන තොග සඳහා ගැලපීම් වැරදි ලෙස භාවිතා කිරීම. ආරම්භක තොග අඩු කරනවා වෙනුවට අයදුම්කරුවන් විසින් ආරම්භක තොග එකතු කර ,අවසාන තොග අඩු කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- ස්ව-අධ්‍යයන පාඨමාලා ග්‍රන්ථයේ අදාල පරිච්ඡේදයේ ඇතුළත් කර තිබෙන සිද්ධාන්ත සහ සූත්‍ර තේරුම් ගැනිම නිර්දේශ කරනු ලැබේ.
- පසුගිය විභාග ප්‍රශ්න වල ඇති මෙවැනි ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයේ විකුණුම් අයවැය ඒකකවලින් සහ වටිනාකමින් සහ නිෂ්පාදන අයවැය ඒකකවලින් දී තිබෙන දත්ත භාවිතයෙන් පිළියෙල කිරීමේ හැකියාව පරීක්ෂාවට ලක් කර ඇත.

**කාර්යයසාධනය:**

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය හොඳ මට්ටමක විය. විෂය දැනුම පුනරීක්ෂණය කළ අයදුම්කරුවෝ හොඳ කාර්යසාධනයක් පෙන්වා තිබූහ.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) වෙළඳපොළ කොටස 18% කින් වැඩි වේ යැයි සලකා විකුණුම්වල වැඩි වීම් ගණනය කිරීම.

(2) අවසාන තොග ඒකක අවශ්‍යතාවය සමග නිපදවිය යුතු ඒකක ගණන සෙවීම.

(3) නිපදවිය යුතු ඒකක ගණන සෙවීමේදී ආරම්භක තොග ඒකක ගණන එකතු කිරීම සහ අවසාන තොග ඒකක ගණන අඩු කිරීම. මෙය වැරදිය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

පසුගිය විභාග ප්‍රශ්නවල ඇති මෙවැනි ආකාරයේ ප්‍රශ්න වලට පිළිතුරු සපයා පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 04

අදාල පිරිවැයකරණ මූලධර්ම සහ හඳුනා ගැනීම් භාවිතකර නිශ්පාදනයක් නිපදවා සැපයීම, පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් සාකච්ඡාවට ලක්කර ඇත.

**කාර්යසාධනය:**

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සැළකිය යුතු තරම් හොඳය. ඇනවුම පිළිගතහොත් දැරිය යුතු පහත සඳහන් දෑ සඳහා වන පිරිවැය ඔවුන් ගණනය කර තිබුණි.

(1) ඇනවුම් සඳහා **X අමුද්‍රව්‍ය** ශේෂයේ පිරිවැය.

(2) ඇනවුම සඳහා **Y අමුද්‍රව්‍යයේ** පිරිවැය.

(3) මෙම ඇනවුම පිළිගතහොත් පුහුණු ශ්‍රම පැය දීමනා පිරිවැය

(4) දැරීමට සිදුවන විචල්‍ය පොදුකාර්ය පිරිවැය

ඉහත සඳහන් ඒවායේ මුළු පිරිවැය ගණනය කර ලැබීමට නියමිත අදායම සසඳා බලා තිබුණි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) දැනටමත් මිලදීගෙන ඇති X අමුද්‍රව්‍ය ශේෂව ඇති අතිරික්ත තොගය ලැබී තිබෙන ඇනවුම් සඳහා භාවිත කළ නොහැකි බවද එහි පිරිවැය, ගිලුණු පිරිවැයක් බවද ලිවීමට අයදුම්කරුවන්ට නොහැකි වී ඇත. ගණනය කිරීම සඳහා මෙම තොග පිරිවැය අයදුම්කරුවන් ගෙන නොතිබුණද මෙ ගිලුණු පිරිවැය නොගන්නා ලද්දේ මන්දැයි පැහැදිලි කිරීමට ඔවුන්ට හැකිවී නැත.

(2) මෙම ඇනවුම සඳහා ප්‍රමාණවත් පුහුණු ශ්‍රමය අදාල නොවන විචල්‍ය පිරිවැයකි. එම නිසා ශ්‍රම පිරිවැය ගණනය කිරීමට නොගත යුතු අතර දිරිදීමනා පිරිවැය අදාල පිරිවැයක් බැවින් එය ගණනය කිරීම සඳහා ගණන් ගත යුතුය.

(3) ශුද්ධ ලාභය හෝ අලාභය සමඟ ඇනවුම කර ගත්තාද නැද්ද යන අවසාන තීරණය සඳහන් නොකිරීම.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

සමාන වර්ගයේ ප්‍රශ්නෝත්තර පසුගිය ප්‍රශ්නපත්‍රවලින් තෝරාගෙන පුරුදු පුහුණු විය යුතු අතර ස්ව අධ්‍යයන පාඨමාලා හෙඳින් විශ්ලේෂණය කළ යුතුය.

## <u>B කොටස</u>

### ප්‍රශ්න අංක 05

(a) ප්‍රශ්නයේ දී තිබෙන පවතින සම්පත් ප්‍රමාණ 3 න් සීමාකාරී සාධකය / සාධක හඳුනා ගැනීමේ හැකියාව.

(b) සීමිත සම්පත් මත පදනම්ව ප්‍රශස්ත නිශ්පාදන මිශ්‍රය ගණනය කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය පිළිබඳව අයදුම්කරුවන්ගේ කාර්යසාධනය යහපත් විය. සීමාකාරී සාධක වෙනුවෙන් දායකත්වය නිවැරදි ලෙස ගණනය කරමින් ඒ තුළින් ප්‍රශස්ත නිශ්පාදන මිශ්‍රය ගණනය කිරීමෙන් ඔවුන් තම හැකියාව පෙන්වා ඇත.

විවිධ ප්‍රමාණ සඳහා දායකය නිවැරදිව ද හොඳින් ද ග්‍රහණය කර තිබුණි. එහෙත් සීමාකාරී සාධකයක් බැගින් වූ දායකය සෙවීමේදී එක් එක් ඒකකයක් සඳහා වූ සම්පත් අවශ්‍යතාවය නිවැරදි ලෙස හඳුනා නොගැනීමෙන් අයදුම්කරුවන් වරද්දාගෙන තිබුණි. කෙසේ වෙතත් ශ්‍රේණිගත කිරීම (Ranking) නිවැරදිව කර තිබුණි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) සීමාකාරී සාධකයක් සඳහා වූ දායකය සෙවීමේදී ගණනය කිරීම් වරදවා ගැනීම.

(2) **(a) කොටස** සඳහා පෙර වැඩ නොගැන්වීම.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න වලට පිළිතුරු ලියා පුහුණු වන්න.

## ප්‍රශ්න අංක 06

2022 අප්‍රේල් මැයි සහ ජූනි මාස සඳහා මුදල් අයවැය පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත..

**කාර්යසාධනය:**

සැලකියයුතු තරම් අයදුම්කරුවන් ගණනක් හොඳ කාර්යසාධනයක් පෙන්වූ අතර අදාල මාස සඳහා විකුණුම් සහ වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණි. ආරම්භක මුදල් ශේෂය නිවැරදිව පෙන්වා තිබුණි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) අයදුම්කරුවන්ගෙන් බහුතරය විසින් 2022 මැයි මාසයේදී රු.230,000/- කට මිලදී ගැනීමට සැලසුම්කර තිබූ පරිගණකය මුදල් අයවැයට ගෙන තිබුණේ නැත.

(2) එක් සාමාජිකයෙකුට රු.80,000/- බැගින් දෙදෙනෙකුට රු.160,000/- ක් පින්තාරු කටයුතු සඳහා දරණ ලද පිරිවැය සමහරක් අයදුම්කරුවන් විසින් සැලකිල්ලට ගෙන නැත.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු ලියා පුහුණු වන්න.
- ස්ව-අධ්‍යන පාඩම් මාලා ග්‍රන්ථවල ප්‍රශ්න හා උත්තර ආශ්‍රිතව පුරුදු පුහුණු වන්න.

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයෙන් සමාගමක සාමාන්‍ය කොටස් පිරිවැය නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය, නිදහස් කළ හැකි ණයකර පිරිවැය, සහ වෙළඳපොළ අගය භාවිතයෙන් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීමේ හැකියාව පරීක්ෂා කර ඇත.

**කාර්යසාධනය:**

අයදුම්කරුවන් බොහොමයක් කොටසක ලාභාංශය, කොටසක වෙළඳ පොල අගය සමග සංසන්ධනය කරමින් සාමාන්‍ය කොටසක අගය නිවැරදිව ගණනය කිරීම නිසා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. කෙසේවෙතත් අයදුම්කරුවන් ස්වල්ප දෙනෙක් ප්‍රශ්නයේ ලාභාංශය වර්ධන අනුපාතයක් දී නැති නමුත් ලාභාංශ වර්ධන සූත්‍රය භාවිතා කර තිබුණේය.

අයදුම්කරුවන් බහුතරය නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණි.

කෙසේ වෙතත් බදුවල බලපෑම සැලකිල්ලට නොගැනීමට සහ ආරම්භක ණය අවසාන වර්ෂ වලදී මුදල් පිටතගැලීම් / ඇතුළට ගැලීම් හඳුනා නොගැනීම නිසා නිදහස් කළ හැකි ණයකර පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණේ නැත.

කෙසේ වුවද වට්ටම් අනුපාතික දෙක භාවිත කරමින් නිවැරදි අභ්‍යන්තර ඵලදා අනුපාතිකය ලබාගෙන ශුද්ධ වර්තමාන අගය නිවැරදි ලෙස ගණනය කර ඇත.

තවද වෙළඳපොල අගය භාවිතයෙන් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

(1) ලාභාංශ වර්ධනයක් නොමැති කල්හි සාමාන්‍ය කොටස් පිරිවැය විසඳීමට ප්‍රයත්න දැරීම.

(2) ණයකර පිරිවැය ගණනය කිරීමේදී බදු අනුපාතිකය නොසලකා හැරීම.

(3) නිදහස් කළ හැකි ණයකර පිරිවැය ගණනය කිරීමේදී ආරම්භක වර්ෂයේ සහ අවසාන වර්ෂයේ මුදල් ගලපා (ඇතුළට සහ පිටතට) හඳුනා නොගැනීම.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු ලියා පුහුණු වන්න.

## C කොටස

### ප්‍රශ්න අංක 08

පහත සඳහන් දෑ ගණනය කිරීම හා පිළියෙල කිරීම තුළින් අයදුම්කරුවන්ගේ විචල්‍ය විශ්ලේෂණය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාවට ලක් කර ඇත.

**(a)** (i) විකුණුම් මිල විචලනය

(ii) ඍජු ශ්‍රම අනුපාත විචලනය

(iii) ඍජු ශ්‍රම මිශ්‍රණ විචල්‍ය

(iv) ඍජු ශ්‍රම ඵලදායිතා විචලනය

**(b)** අයවැයගත දායකය, සත්‍ය දායකය සමඟ සැසඳීම සඳහා මෙහෙයුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම.

**කාර්යසාධනය:**

සමස්ත කාර්යසාධනය දුර්වලය.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

බොහොමයක් අයදුම්කරුවන් විකුණුම් මිල විචලනය සහ ඍජු ශ්‍රම අනුපාත විචලනය යන විචලනයන් නිවැරදිව ගණනය කර ඒවා සඳහා වූ ලකුණු පමණක් උපයාගෙන තිබුණි. කෙසේවෙතත් ඍජු ශ්‍රම මිශ්‍රණ සහ සෘජු ශ්‍රම ඵලදායීතා විචලනයන් ගණනය කිරීමට මොවුන්ට අපහසු විය. එබැවින් අයදුම්කරුවන් ලකුණු අහිමි කරගෙන තිබේ.

අයවැය ගත දායකය සත්‍ය දායකය සමඟ සැසඳීම නිවැරදිව සිදුකර මෙහෙයුම් ප්‍රකාශනයක පෙන්වා තිබුණි.

**අසමත් වීමට තුඩු දිය හැකි හේතු:**

(1) මිශ්‍ර හා ඵලදායීතා විචලනයන් ගණනය කිරීමේ හුරුපුරුදු වීම් නොමැතිව තිබූ බව දක්නා ලදී .

(2) සෘජු ශ්‍රම අනුපාත සහ සෘජු ශ්‍රම මිශ්‍රණ විචලනයක් ගණනය කිරීමේදී ප්‍රමිත (Stranded) ශ්‍රම පැය ගෙන තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් විචලනයන් අහිතකර [Adverse (A)] හෝ හිතකර [Favorable (F)] දැයි දක්වා තිබුණේ නැත.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

විෂය ක්ෂත්‍රයේ පසුගිය ප්‍රශ්නෝත්තර පුරුදු පුහුණු කළ යුතුය.

## ප්‍රශ්න අංක 09

ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීමේ හැකියාව සහ ඒ අගය මත පදනම්ව ආයෝජනයේ ශක්‍යතාවය තක්සේරු කිරීමේ හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

**කාර්යසාධනය:**

අයදුම්කරුවන් සියළුම දෙනා මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර කාර්යසාධනය සතුටුදායක විය. ස්වල්ප දෙනෙකු හැර බොහොමයක් අයදුම්කරුවන්ගේ සාර්ථක වෑයමකි.

**දුර්වල කාර්යසාධනයට හේතු:**

පහත දෑ ගණනය කිරීමේදී අයදුම්කරුවන්ට ගැටළු තිබී ඇත.

(1) ක්ෂය නොමැතිව ස්ථාවර පිරිවැය.

(2) අවුරුදු 4 ක් වෙනුවට සම්පූර්ණ ව්‍යාපෘති කාලසීමාව වන අවරුදු 05 කට ප්‍රාග්ධන දීමනා ගණනය කිරීම

(3) ක්ෂය ගැලපීම සලකමින් වැරදි ලෙස බදු ගණනය කිරීම.

(4) බදු ගණනය කිරීම් වෙනමම නොපෙන්වීම. ඒ වෙනුවට ව්‍යාපෘති ඇගයීම පෙර වැඩවල සියළුම පෙරවැඩ පෙන්වා ව්‍යාපෘති ඇගයීම සලකා බැලීමේදී මුදල් ගැලීම් ඒ මඟින් ව්‍යාකූල තත්වයට පත් කිරීම.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

විෂයට අදාල සිද්ධාන්තමය සංකල්ප ස්වඅධ්‍යයන පාඨමාලා ග්‍රන්ථ භාවිත කර පැහැදිලි ලෙස අවබෝධ කර ගැනීම නිර්දේශ කරන අතර මෙම ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්නෝත්තර වැඩියෙන් ප්‍රගුණ කර පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නයේ **(A) කොටසින්** සමාගමක එක්තරා නිශ්පාදනයක සමානුපාතික ඒකක හා පිරිවැය දැක්වෙන ප්‍රකාශන පිළියෙල කිරීම සහ (II) වන පෙරසැරි ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුමද **(B) කොටසින්** නව නිශ්පදාන අලෙවිය සඳහා බාහිර විකුණුම් කණ්ඩායමක සේවය ලබා ගත යුතුද නැතහොත් අභ්‍යන්තර විකුණුම් කණ්ඩායමක සේවය ලබා ගත යුතු දැයි ගණනය කිරීම සහිතව තක්සේරු කිරීමේ හැකියාව පිළිබඳ දැනුමද පරීක්ෂාවට ලක් කර තිබේ.

**කාර්යසාධනයඃ**

**(A) කොටස** සඳහා පෙරසැරි ගිණුම පිළයෙල කිරීම වෙනුවෙන් අයදුම්කරුවන් ලකුණු ලබාගෙන තිබූ නමුත් විශේෂයෙන් අවසාන නොනිමි තොගයේ සමානුපාතික ඒකක ගණනය කරමින් සමානුපාතික ඒකක පිරිවැය ප්‍රකාශණය පිළියෙල කිරීම සඳහා ලකුණු ලබාගෙන නැත. සමහරු අසාමාන්‍ය අපතයේ වූ සමානුපාතික ඒකක ප්‍රමාණය ප්‍රකාශනයට ගෙන ඇත. සාමාන්‍ය අපතයේ සුන් බුන් අගය සමානුපාතික ඒකක සහ පිරිවැය ප්‍රකාශනයේ පිරිවැය ගණනයේ ලබා ගැනීමේදී සලකා බලා තිබුනේ නැත.

**(B) කොටස** සඳහා අපේක්ෂිත විකුණුම් සහ සම්භාවිතාවන් යොදා ගනිමින් අදාල විචල්‍ය පිරිවැය නිවැරදි ලෙස ගණනය කිරීම නිසා කාර්යසාධනය සතුටුදායක විය.

කෙසේවෙතත්, විකුණුම් අගයන් නොසලකා හැරීම නිසා විකුණුම් කොමිස් නිවැරදිව ගණන් බලා ගණනය කර නැත. ඒ වෙනුවට අයදුම්කරුවන් දායකයේ වටිනාකම විකුණුම් කොමිස් ගණනය කිරීම සඳහා භාවිතා කර ඇත. තවද ස්ථාවර පිරිවැය ද ගණනය කිරීමට යොදාගෙන ඇති අතර විකල්ප දෙක යටතේම පොදු වියදමක් නිසා එය කිසිසේත් අවශ්‍ය නැත.

**දුර්වල කාර්යසාධනයට හේතුඃ**

- නිෂ්පාදන ප්‍රමාණයන් ගණනය කිරීමේදි සම්භාවිතාවන් සැලකිල්ලට ගෙන නොතිබීම.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

(1) පසුගිය ප්‍රශ්න පත්‍රවල ඇතුලත් කර තිබු සමාන වර්ගයේ ප්‍රශ්න හා යෝජිත උත්තර පුරුදු පුහුණු වීම.

(2) ස්ව-අධ්‍යයන පාඨමාලා ග්‍රන්ථ පරිහරණය

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -